## පළමුවන කියැවීම

ක්‍රියා 3:13-15,17-20

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**ඔබ ජීවනයේ සවාමියාණන් මරණයට පත් කළහුය. එහෙත් දෙවියන් වහන්සේ එතුමන් මරණයෙන් උත්ථාන කළ සේක.**

ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ජාකොබ්ගේ ද දෙවි වූ අපගේ පියවරුන්ගේ දෙවියන් වහන්සේ තමන් සේවකයා වූ ජේසුස් වහන්සේ මහිමයට පැමිණ වූ සේක. එහෙත්, ඔබ උන්වහන්සේ නඩු ශාලාවට පැමිණෙව්ව හුය. තවද පිලාත් උන්වහන්සේ නිදහස් කරන්නට තීරණය කරගෙන සිටි විට ඔහු ඉදිරියේ ම ඔබ උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහුය. ඔබ සුවිශුද්ධ වූ ධර්මිෂ්ඨ වූ තැනන්වහන්සේ ප්‍රතික්ෂේප කර ඒ වෙනුවට මිනීමරුවකු මුදාදෙන මෙන් ඉල්ලා සිටියහු ය. මෙසේ ඔබ ජීවනේශ්වරයාණන් මරණයට පත්කළාහුය. එහෙත් දෙවියන් වහන්සේ උන්වහන්සේ මරණයෙන් උත්ථාන කර වදාළ සේක. අපි ඊට සාක්ෂිකාරයෝ වම්හ. "දැන් ඉතින් සහෝදරවරුනී, ඔබගේ ප්‍රධානීන් මෙන්ම ඔබද, නොදැනුම් කමින් ක්‍රියා කළ බව මම දනිමි. එසේ වුවත්, ස්වකීය ක්‍රිස්තුස් වහන්සේ දුක්විඳිය යුතු යයි දෙවියන් වහන්සේ සියලු දිවැසිවරයන්ගේ මුවින් පෙර දන්වා වදාළ දේ, මෙසේ සම්පූර්ණ කළ සේක. එබැවින්, ඔබේ පව් මකාලන පිණිස ද දෙවියන් වහන්සේ කෙරෙන් නව ජීවන යුගයක් පැමිණෙන පිණිස ද ඔබ උදෙසා පෙර නියම කරන ලද ක්‍රිස්තුස් නම් ජේසුස් වහන්සේ එවා වදාරණ පිණිස ද මනස්ථාපනය වී දෙවියන් වහන්සේ වෙත හැරෙන්න.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 4:1,3,6,8

පිළිතුර: **සමිඳුනි, අප වෙත ඔබ කරුණා නෙත් යොමුකළ මැනව. ආලේලූයා! ආලේලූයා!**

ගීය: මා රක්නා මාගේ දෙවිඳුනි, මේ යාදින්නට පිළිතුරු දුන මැනව, විපතේ දී ඔබ මා මිදූ සේක. මට කරුණාකර මේ යැදුමට සවන් දුන මැනව.

සමිඳාණන් දැහැමි අය තමන්ට ම තෝරා ගත් බව සිතට ගන්න. එතුමාණෝ මාගේ යැදුමට සවන් දෙන සේක. යළි අපට ප්‍රීතිය පෙන්වන්නේ කවරෙක් දැ"යි බොහෝ දෙන කියති.

සමිඳුනි, අප වෙත ඔබ කුළුනැස යොමුකළ මැනව. මම ශාන්ත සිතින් සැතපී, වහා නින්දට යමි. මන්ද, සමිඳුනි, ඔබ මට සුරැකිව විසීමට වර දෙන සේක.

## දෙවන කියැවීම

1 ජුවාම් 2:1-5

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**අපේ පව් උදෙසා ද සකල ලෝකයේ පව් උදෙසා ද ශාන්තිකර යාගය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.**

මාගේ ප්‍රිය දරුවෙනි, මේ කාරණා මා ඔබට ලියා එවන්නේ ඔබ පව් නොකරණ පිණිසය. එහෙත් යමකුට පව් කළොත්, ධර්මිෂ්ඨ වූ ජේසුස් ක්‍රිස්තුස් නම් මැදහත් කාරයාණන් වහන්සේ කෙනෙක් අප වෙනුවෙන් පියාණන් වහන්සේ වෙත සිටින සේක. අපේ පාපය නැසීමේ පිළියම උන්වහන්සේය. එය අපේ පව් උදෙසා පමණක් නොව සකල ලෝකයාගේ පව් උදෙසාය. අපි උන්වහන්සේගේ ආඥා පිළිපදිමු නම්, එයින් අප උන්වහන්සේ දන්නා බව සහතික වේ. "මම උන්වහන්සේ දනිමි" යි කියමින්

උන්වහන්සේගේ ආඥා නොපිළිපදින තැනැත්තා බොරු කාරයෙකි. සත්‍යය ඔහු තුළ නැත. එහෙත් යමෙක් උන්වහන්සේගේ දහම පිළිපදින්නේ ද ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත. අප උන්වහන්සේ තුළ සිටින බව දැනගන්නේ මෙසේය. දේව වාක්‍යය එසේ ය.

**සාධුකාරය** ලූක් 24:32

ආලේලූයා! ආලේලූයා!

ජේසු සමිඳුනි, ශුද්ධ වූ ලියවිල්ල අපට පහදා දුන මැනව.
ඔබ අප සමග කතාකරන විට අප හදවත් දැවී ඇවිලී යන්නට සැලසුව මැනව.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 24:35-49

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මරණින් නැගිටින්නටත් යුතු යයි ලියා ඇත්තේය.**

එවිට ශ්‍රාවකයෝ ද මගදී තමන්ට සිදු වූ කාරණා සහ පූප කැඩීමේදී ඔවුන්ට උන්වහන්සේ ප්‍රකාශ වූ හැටි ද පැවසූහ. ශ්‍රාවකයන් මෙසේ කතා කරමින් සිටියදී උන්වහන්සේ ඔවුන් මැදට වැඩම කර, "ඔබට ශාන්තිය වේවා" යි වදාළ සේක. එහෙත් ඔවුහු ත්‍රස්තව භීතියට පත්ව, ඒ අවතාරයෙකැ යි සිතූහ. උන්වහන්සේ ඔවුන්ට කතා කොට, "ඔබ කැළඹී සිටින්නේ මන්ද? ඔබගේ සිත් වල සැක උපදින්නේත් මන්ද? මාගේ අත් හා පා බලන්න. මේ මා ම බව තේරුම් ගන්න. මා ස්පර්ශ කොට බලන්න, ඔබට පෙනෙන ලෙස ඇට මස් සහිත සිරුරක් මට ඇත. අවතාරයකට නම් ඒවා නැතැ"යි වදාළ සේක. උන්වහන්සේ මෙවදන් කියා, තම අත් හා පා ඔවුන්ට පෙන් වූ සේක. ඔවුන් ප්‍රීතිය නිසා විශ්වාස නොකොට පුදුම වෙමින් සිටියදී, උන්වහන්සේ ඔවුන්ට කතා කොට, "කෑමට යමක් මෙහි ඔබ වෙත තිබේදැ" යි ඇසූ සේක. ඔවුහු බැදපු මාළු කෑල්ලක් උන්වහන්සේට පිළිගැන්වූහ. උන්වහන්සේ එය පිළිගෙන ඔවුන් ඉදිරිපිට දී වැළඳූ සේක. තවද උන්වහන්සේ කතා කරමින්, "මා පිළිබඳ මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද ගීතාවලියෙහි ද ලියා ඇති හැම දෙයම ඉෂ්ට විය යුතු යයි මා ඔබ සමඟ සිටියදී ඔබට පැවසූ වචනයෙහි තේරුම මේ ය"යි වදාළ සේක. එවිට උන්වහන්සේ ශුද්ධ ලියවිල්ල ඔවුන්ට වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා කතා කොට "මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳින්නටත් තුන්වනදා මළවුන්ගෙන් නැගිටින්නටත්, ජෙරුසෙලමෙන් පටන් ගෙන සකල ලෝකවාසීන්ට මනස්ථාපය ද පව් කමාව ද, උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතුම යයි ලියා ඇත. ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහුය. බලන්න, මම මාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව ඔබ වෙත ගෙනෙමි. එහෙත් ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී සිටින්නැ" යි වදාළ සේක. සුවිශේෂ වාක්‍යය එසේ ය.